# අට්ඨාරසමො පාඨො

## මහාවංසො

1. වංගෙසු වංගනගරෙ - වංගරාජා අහූ පුරෙ,
කාලිංගරඤ්ඤො ධීතාසි - මහෙසි තස්ස රාජිනො.

2. සො රාජා දෙවියා තස්සා - එකං අලභි ධීතරං,
නෙමිත්තා ව්‍යාකරුං තස්සා - සංවාසං මිගරාජිනා.

3. අතීව රූපිනී ආසී - අතීව කාමගිද්ධිනී,
දෙවෙන දෙවියා චාපි - ලජ්ජායාසි ජිගුච්ඡිතා.

4. එකාකිනී සා නික්ඛම්ම - සෙරිචාරසුඛත්ථිනී,
සත්ථෙන සහ අඤ්ඤාතා - අගා මගධගාමිනා.

5. ලාලරට්ඨෙ අටවියා - සීහො සත්ථ'මභිද්දවි,
අඤ්ඤත්ථ සෙසා ධාවිංසු - සීහාගතදිසන්තු සා.

6. ගණ්හිත්වා ගොචරං සීහො - ගච්ඡං දිස්වා තමාරකා
රත්තො උපාග ලාලෙන්තො - ලංගුලං පන්නකණ්ණකො.

7. සා තං දිස්වා සරිත්වාන - නෙමිත්තවචනං සුතං,
අභීතා තස්ස අඞ්ගානි - රංජයන්තී පරාමසි.

8. තස්සා ඵස්සෙනා'තිරත්තො - පිට්ඨිං ආරොපියාසු තං,
සීහො සකං ගුහං නෙත්වා - තාය සංවාස'මාචරි.

9. තෙන සංවාසමන්වාය - කාලෙන යමකෙ දුවෙ,
පුත්තං ච ධීතරංචා'ති - රාජධීතා ජනෙසි සා.

10. පුත්තස්ස හත්ථපාදාසුං - සීහා'කාරා තතො අකා,
නාමෙන සීහබාහුං තං - ධීතරං සීහසීවලිං.

11. පුත්තො සොළසවස්සො සො - මාතරං පුච්ඡි සංසයං,
"තුවං පිතා ච නො අම්ම - කස්මා විසදිසා ඉති.


නොමිලේ බෙදා හැරීම පිණිසයි

12. සා සබ්බ’මබ්‍රවී තස්ස- “කිං න යාමා”ති සො’බ්‍රවි,
“ගුහං ථකෙති තාතො තෙ- පාසාණෙනා”ති, සා බ්‍රවි.

13. මහාගුහාය ථකනං - ඛන්ධෙ නාදාය සො අකා,
එකාහෙනෙව පඤ්ඤාස - යොජනානි ගතාගතං.

14 ගොචරාය ගතෙ සීහෙ - දක්ඛිණංසම්හි මාතරං,
වාමෙ කනිට්ඨිං කත්වාන - තතො සීඝං අපක්කමි.

15 නිවාසෙත්වාන සාඛං තෙ - පච්චන්තං ගාම’මාගමුං,
තත්ථා’සි රාජධීතාය - මාතුලස්ස සුතො තදා.

16 සෙනාපති වංගරඤ්ඤො - ඨිතො පච්චන්තගාමකෙ
නිසින්නො වටමූලෙ සො - කම්මන්තං සංවිධාපයං

17 දිස්වා තෙ පුච්ඡි තෙ’වොචුං - “අටවීවාසිනො මයං”.
ඉති සො දාපයී තෙසං - වත්ථානි ධජිනීපති.

18 තානාහෙසුං උළාරානි - භත්තං පණ්ණෙසු දාපයි,
සොවණ්ණභාජනානාසුං - තෙසං පුඤ්ඤෙන තානි ච.

19 තෙන සො විම්හිතො පුච්ඡි - “කෙ තුම්හෙ”ති, චමූපති,
තස්ස සා ජාති ගොත්තානි - රාජධීතා නිවෙදයි,

20 පිතුච්ඡාධීතරං තං සො - ආදාය ධජිනීපතී,
ගන්ත්වාන වංග නගරං - සංවාසං තාය කප්පයි.

21 සීහො සීඝං ගුහං ගන්ත්වා - තෙ අදිස්වා තයො ජනෙ,
අට්ටිතො පුත්තසොකෙන - න ච ඛාදි න චාපිවි.

22 දාරකෙ තෙ ගවෙසෙන්තො - අගා පච්චන්තගාමකෙ,
උබ්බාසීයති සො සො’ව - යං යං ගාමමුපෙති සො.

23 පච්චන්තවාසිනො ගන්ත්වා - රඤ්ඤො තං පටිවෙදයුං,
“සීහො පීළෙති තෙ රට්ඨං - තං දෙව පටිසෙධය”.

24 අලභං නිසෙධකං තස්ස - හත්ථික්ඛන්ධගතං පුරෙ,
ආදෙතු “සීහදායී”ති - සහස්සං සො පචාරයි.

25 තථෙව දෙව සහස්සානි - තීණි චා'පි නරිස්සරො,
ද්වීසු වාරෙසු වාරෙසි - මාතා සීහභුජං හි තං.

26 අග්ගහි තතියෙ වාරෙ - සීහබාහු අපුච්ඡිය,
මාතරං තිසහස්සං තං - ඝාතෙතුං පිතරං සකං.

27 රඤ්ඤා කුමාරං දස්සෙසුං - තං රාජා ඉද'මබ්‍රවී,
"ගහිතො යදි සීහො තෙ - දම්මි රට්ඨං තදෙව තෙ."

28 සො තං ගන්ත්වා ගුහාද්වාරං - සීහං දිස්වා'ව ආරකා,
එන්තං පුත්තසිනෙහෙන - විජ්ඣිතුං තං සරං ඛිපි.

29 සරො නලාට මාහච්ච - මෙත්තචිත්තෙන තස්ස තු,
කුමාරපාදමූලෙ'ව - නිවත්තො පති භූමියං.

30 තථා'සි යාව තතියං - තතො කුජ්ඣි මිගාධිපො,
තතො ඛිත්තො සරො තස්ස - කායං නිබ්භිජ්ජ නික්ඛමි.

31 සකෙසරං සීහසීසං - ආදාය ස පුරං අගා,
මතස්ස වංගරාජස්ස - සත්තාහානි තදා අහූ.

32 රඤ්ඤා අපුත්තකත්තා ච - පතීතා චස්ස කම්මුනා,
සුත්වා ච රඤ්ඤා නත්තුත්තං - සංජානිත්වා ච මාතරං.

33 අමච්චා සන්නිපතිතා - අඛිලා එකමානසා,
සීහබාහුකුමාරස්ස - "රාජා හොහී"ති අබ්‍රවුං.

34 සො රජ්ජං සම්පටිච්ඡිත්වා - දත්වා මාතුපතිස්ස තං,
සීහසීවලිමාදාය - ජාතභූමිං ගතො සයං.

35 නගරං තත්ථ මාපෙසි - අහු සීහපුරන්ති තං,
අරඤ්ඤෙ යොජනසතෙ - ගාමෙ චාපි නිවෙසයි.

36 ලාළරට්ඨෙ පුරෙ තස්මිං - සීහබාහු නරාධිපො,
රජ්ජං කාරෙසි කත්වාන - මහෙසිං සීහසීවලිං.

37 මහෙසි සොළසක්ඛත්තුං - යමකෙ'ව දුවෙ දුවෙ,
පුත්තෙ ජනයි කාලෙ සා - විජයො නාම ජෙට්ඨකො.


නොමිලේ බෙදා හැරීම පිණිසයි

38 සුමිත්තො නාම දුතියො - සබ්බෙ දවත්තිංස පුත්තකා,
කාලෙන විජයං රාජා - උපරජ්ජෙ'භිසෙචයී.

39 විජයො විසමාචාරො - ආසි තම්පරිසා'පි ච
සහසානි අනෙකානි දුස්සහානි කරිංසු තෙ

40 කුද්ධො මහාජනො රඤ්ඤො - තමත්ථං පටිවෙදයි,
රාජා තෙ සඤ්ඤපෙත්වාන - පුත්තං ඔවදි සාධුකං.

41 සබ්බං තථෙව දුතියං - අහොසි තතියම්පන,
කුද්ධො මහාජනො ආහ - "පුත්තං ඝාතෙහි තෙ" ඉති.

42 රාජා'ථ විජයං තං ච - පරිවාරං ච තස්ස තං,
සත්තසතානි පුරිසෙ - කාරෙත්වා අඩ්ඪමුණ්ඩකෙ.

43 නාවාය පක්ඛිපාපෙත්වා - විස්සජ්ජාපෙසි සාගරෙ,
තථා තෙසං හරියායො - තථෙ'ව ච කුමාරකෙ.

44 විසුං විසුං තෙ විස්සට්ඨා - පුරිසි'ත්ථි කුමාරකා,
විසුං විසුං දීපකස්මිං - ඔක්කමිංසු වසිංසු ච.

45 නග්ගදීපො'ති ඤායිත්ථ - කුමාරොක්කන්තදීපකො,
හරියොක්කන්තදීපොතු - මහිලාදීපකො ඉති.

46 සුප්පාරකෙ පට්ටනම්හි - විජයො පන ඔක්කමි
පරිසාසාහසෙනෙත්ථ - හීතො නාවං පුනාරුහි

47 ලංකායං විජයස'නාමකො කුමාරො
ඔතිණ්ණො ථිරමති තම්බපණ්ණිදීපෙ
සාලානං යමකගුණාන'මන්තරස්මිං
නිබ්බාණං සයිතදිනෙ තථාගතස්ස

සුජනප්පසාදසංවෙගත්ථාය කතෙ මහාවංසෙ විජයාගමනො නාම ඡට්ඨො පරිච්ඡෙදො

1. **පුරෙ** පෙර, **වංගෙසු** වංගරට, **වංගනගරෙ** වංගනුවර, **වංගරාජා** වංග නම් රජෙක්, **අහු** විය, **කාලිංගරඤ්ඤො** කාලිංගරජුගේ, **ධීතා** දියණිය, **තස්ස රාජිනො** ඒ රජුගේ, **මහෙසී ආසි** මෙහෙසිය වූවා ය.

2. **සො රාජා** ඒ රජු, **තස්සා දෙවියා** ඒ දේවියගෙන්, **එකං ධීතරං** එක් දියණියක, **අලභි** ලැබී ය, **තස්සා** ඇයගේ, **මිගරාජිනා** මෘගරාජයකු (සිංහයෙකු) සමග **සංවාසං** සංවාසය (විවාහය), **නෙමිත්තා** නිමිති දන්නෝ, **ව්‍යාකරුං** ප්‍රකාශ කළහ.

3. **අතීව රූපිනී** අතිශයින් රූමත් වූ ඇය, **අතීව** අතිශයින්, **කාමගිද්ධිනී** කාමයෙහි ගිජු වූවා ය, **දෙවෙන** රජු විසින් ද, **දෙවියා ච අපි** දේවිය විසින් ද, **ලජ්ජාය** ලජ්ජාවෙන්, **ජිගුච්ඡිතා ආසි** පිළිකුල් කරන ලද්දියක් වූවා ය.

4. **සෙරිචාරසුඛත්ථිනී** ස්වෛරීව හැසිරීමේ සුවය කැමති වූ, **සා** ඇය, **එකාකිනී** තනිවම, **නික්ඛම්ම** නික්ම, **අඤ්ඤාතා** අප්‍රකටව (වෙස්වලාගෙන), **මගධගාමිනා** මගධයට යන, **සත්ථෙන** සහ තවලමක් සමග (වෙළඳ කණ්ඩායමක්), **අගා** ගියාය.

5. **ලාලරට්ඨෙ** ලාල නම් රට, **අටවියා** වනයේ දී, **සීහො** සිංහයෙක්, **සත්ථං** තවලම, **අභිද්දවි** ඉදිරියට අවේ ය, **සෙසා** සෙසු පිරිස, **අඤ්ඤත්ථ** වෙනතක, **ධාවිංසු** දිවූහ, **සා** ඇය, **සීහාගත දිසං තු** සිංහයා පැමිණි දිශාවට (ගියාය).

6. **සීහො** සිංහයා, **ගොචරං ගණ්හිත්වා** ගොදුරු ගෙන, **ගච්ඡං** යන්නේ, **තං** ඈ, **ආරකා** දුරදීම, **දිස්වා** දැක, **රත්තො** (ඈ කෙරේ) ඇලුණේ, **පනතකණ්ණකො** කන් නවාගෙන, **ලංගුලං ලාලෙන්තො** වලිගය වනමින් **උපාග** (ඈ) වෙත ආවේ ය.

7. **සා** ඇය, **තං දිස්වා** ඌ දැක, **සුතං** අසන ලද, **නෙමිත්තවචනං** නිමිති පාඨකයන්ගේ වචනය, **සරිත්වාන** සිහිකොට, **අභීතා** බිය නොවූවා, **තස්ස අංගානී** උගේ ශරීරය, **රංජයන්ත** සතුටු කරවමින්, **පරාමසි** පිරිමැද්දා ය.

8. **තස්සා** ඇයගේ, **ඵස්සෙන** පහසින්, **අතිරත්තො** අතිශයින් ඇලුණු, **සීහො** සිංහයා, **ආසු** වහා, **තං** ඇය, **පිට්ඨිං ආරොපිය** පිටට නංවාගෙන, **සකං ගුහං** සිය ගුහාවට, **නෙත්වා** පමුණුවා, **තාය** ඈ සමග, **සංවාසං ආචරි** සංවාසයේ යෙදුණේ ය.

9. **සා රාජධීතා** ඒ රාජදියණිය, **තෙන** ඒ සිංහයා සමග, **සංවාසමන්වාය** සංවාසය නිසා, **කාලෙන** කල්යෑමෙන්, **පුත්තං ච** පුතෙකු ද, **ධීතරං ච** දියණියක ද, **යමකෙ** **දුවෙ** නිවුන් දරු දෙපළක්, **ජනෙසි** බිහිකළා ය.

10. **පුත්තස්ස** පුතුගේ, **හත්ථපාද**, අත්පා, **සීහාකාරෝ** සිංහයාගේ මෙන්, **ආසුං** විය, **තතෝ** එනිසා, **තං** ඔහු, **නාමෙන** නමින්, **සිංහබාහුං** සීහබාහු ද, **ධීතරං** දියණිය, **සීහසීවලිං** සිංහසීවලී ද යැයි, **අකා** (නම්) කළේය.

11. **සොළසවස්සො** සොළොස් වියැති, **සො පුත්තො** ඒ පුතා, **මාතරං** මවගෙන්, **සංසයං** සැකයක්, **පුච්ඡි** විචළේ ය, **නො** අපගේ, **අම්ම** මෑණියනි, **ත්වං** **ච** ඔබ ද, **පිතා** **ච** පියා ද, **කස්මා** කුමක් නිසා, **විසදිසා** අසමාන වන්නේ ද, **ඉති** යනුවෙනි.

12. **සො** ඈ,**තස්ස** ඔහුට, **සබ්බං** සියල්ල, **අබ්‍රවි** කීවා ය, **සො** හෙතෙම, **කිං** කුමක් නිසා, **න යාම ඉති** නො යමු දැයි, **අබ්‍රවී** කීය, **තෙ තාතො** ඔබේ පියා, **පාසාණෙන** ගලකින්, **ගුහං** ගුහාව, **ථකෙති ඉති** වසයි යැයි, **සා** ඈ, **අබ්‍රවී** කීවා ය.

13. **සො** ඒ කුමාරයා, **මහාගුහාය** මහා ගුහාවෙහි, **ථකනං** වසන දොර, **ඛන්ධෙන** **ආදාය** උරහිසින් ගෙන, **එක අහෙන** එව එක්දවසකින් ම, **පඤ්ඤාසයොජනානි** යොදුන් පන්සියයක්, **ගතාගතං** යාම් ඊම්, **අකා** කළේ ය.

14. **සීහො ගොචරාය ගතෙ** සිංහයා ගොදුරු පිණිස ගිය කල්හි, **මාතරං** මව, **දක්ඛිණංසම්හි** දකුණු උරහිසෙහි ද, **කනිට්ඨිං** බාල නැගණිය, **වාමෙ** වම් උරහිස ද, **කත්වාන** කොට, **තතො** එතනින්, **සීඝං** වහා, **අපක්කමි** (නික්මුණේය) ඉවත්විය.

15. **තෙ** ඔවුහු, **සාඛං** අතු, **නිවාසෙත්වාන** හැඳ, **පච්චන්තං** **ගාමං** පසල් ගමකට, **ආගමුං** ගියහ. **තදා** එකල, **තත්ථ** එහි, **රාජධීතාය** රජදියණියගේ, **මාතුලස්ස** **සුතො** මාමාගේ පුතා, **ආසි** විය.

16. වංගරඤ්ඤො **සෙනාපති** වංගරජුගේ සෙන්පතියා, **පච්චන්තගාමකෙ** ප්‍රත්‍යන්ත ගමෙහි, **ඨිතො** සිටියේ ය. **සො** හෙතෙම, **කම්මන්තං සංවිධාපයං** කර්මාන්ත සංවිධානය කරමින්, **වටමූලෙ** නුගගසක් මුල, **නිසිනෙනා** හුන්නේය.

17. **තෙ** **දිස්වා** ඔවුන් දැක, **පුච්ඡි** විචාළේය, **මයං** අපි, **අටවිවාසිනො ඉති** වනවාසීහු යැයි, **තෙ** ඔවුහු, **අවොචුං** කීවාහු ය. **සො** **ධජිනීපතී** ඒ සෙන්පතියා, **තෙසං** ඔවුන්ට, **වත්ථානි** වස්ත්‍ර, **දාපයී** දෙවීය.

18. **තානි** ඒ වස්ත්‍ර, **උළාරානි අහෙසුං** මහඟු විය. **පණ්ණෙසු** කොළවල, **භත්තං** බත් **දාපයී** දෙවීය, **තෙසං පුඤ්ඤෙන** ඔවුන්ගේ පිනෙන්, **තානි** ඒවා, **සොවණ්ණභාජනානි** රන් බඳුන්, **අහෙසුං** වීය.

19. **තෙන** ඒ කරුණෙන්, **විම්හිතො** විස්මයට පත්, **සො චමූපති** ඒ සෙන්පතියා, **කෙ තුම්හෙ ඉති** නුඹලා කවරහු දැයි, **පුච්ඡි** විචාළේ ය. **සා රාජධීතා** ඒ රජදියණිය, **තස්ස** ඔහුට, **ජාතිගොත්තානි** ජාති ගෝත්‍රයන්, **නිවෙදයී** දැනුම් දුන්නා ය.

20. **සො ධජිනීපති** ඒ සේනාපති තෙම, **තං පිතුච්ඡාධීතරං** ඒ මාමාගේ දියණිය, **ආදාය** රැගෙන, **වංගනගරං** වංග නගරයට, **ගන්ත්වාන** ගොස්, **තාය** ඈ සමග, **සංවාසං කප්පයී** වාසය කළේ ය.

21. **සීහො** සිංහයා, **සීඝං** වේගයෙන්, **ගුහං ගන්ත්වා** ගුහාවට ගොස්, **තෙ තයො ජනෙ** ඒ තිදෙනා, **අදිස්වා** නොදැක, **පුත්තසොකෙන** දරු සෙනෙහසින්, **අට්ටිතො** පෙළුණේ, **න ච ඛාදි** නො කෑවේ ය. **න ච පිවි** නො බීවේ ය.

22. (ඒ සිංහයා) **තෙ දාරකෙ** ඒ දරුවන්, **ගවෙසන්තො** සොයමින්, **පච්චන්තගාමකෙ** පසල් ගම්වලට, **අගා** ගියේ ය. **සො** ඒ සිංහයා, **යං යං ගාමං** යම් ගමකට, **උපෙති** එළඹේ නම්, **සො සො එව** ඒ ඒ ගම් ම, **උබ්බාසීයති** බැහැර කෙරේ (පාළු කරනු ලැබේ)

23. **පච්චන්තගාමවාසිනො** පසල්ගම් වැසියෝ, **ගන්ත්වා** ගොස්, **රඤ්ඤො** රජුට, **තං** එය **පටිවෙදයුං** දැන්වූහ, **දෙව,** දේවයන් වහන්ස, **තෙ** ඔබගේ, **රට්ඨං** රට, **සීහො** සිංහයෙක්, **පීළෙති** පෙළයි, **තං** එය, **පටිසෙධය** වළක්වනු මැනවි.

24. **තස්ස නිසෙධකං** ඒ සිංහයාගේ ක්‍රියාව වළක්වන්නෙක්, **අලභං** නොලබන්නා වූ **සො,** ඒ රජතුමා '**සීහදායී**' **සහස්සං** සීහදායී (සිංහයා අල්වා දෙන්නාට දෙනු ලබන කහවණු) දහසක්, **හත්ථික්ඛන්ධගතං,** ඇතෙකු පිට තබා, **ආදෙන්තු ඉති** ගනීවා යැයි, **පුරෙ** නගරයෙහි, **පචාරයි** ප්‍රචාරය කළේය.

25. **නරිස්සරො** රජතුමා, **තථෙව** එසේම, **ද්වෙ සහස්සානි** දෙදහසක්, **තීණි ච සහස්සානි** තුන්දහසක් ද යැයි (ප්‍රචාරය කරවීය), **මාතා හි** මව වනාහි, **තං සීහභුජං** සිංහබාහු, **ද්වීසු වාරෙසු** දෙවරක් **වාරෙසි** වැළැක්වුවා ය.

26. **සීහබාහු** සිංහබාහු, තෙම **තතියවාරෙ** තුන්වන වර, **මාතරං අපුච්ඡිය** මවගෙන් නොවිමසා, **සකං පිතරං** තමාගේ පියා, **ඝාතෙතුං** මරන්නට, **තං තිසහස්සං** ඒ තුන්දහස, **අග්ගහී** ගත්තේය.

27. **රඤ්ඤො** රජුට, **කුමාරං** කුමාරයා, **දස්සෙසුං** දැක්වූහ. **රාජා** රජතුමා, **තං** ඔහුට, **ඉදං අබ්‍රවිං** මෙය කීය, **යදි** යම්හෙයකින්, **තෙ** තා විසින්, **සීහො** සිංහයා, **ගහිතො** අල්ලා ගන්නා ලද්දේ නම්, **තං රට්ඨං** ඒ රට, **තෙ එව** ඔබට ම, **දම්මි** දෙමි.

28. **සො** ඒ සිංහබාහු, තෙමේ, **තං ගුහාද්වාරං ගන්ත්වා** ඒ ගුහාද්වාරයට ගොස්, **ආරකා** දුරදී ම, **දිස්වා** දැක, **පුත්තසිනෙහෙන** පුත්‍ර සෙනෙහයෙන්, **එන්තං** එන්නා වූ, **සීහං** සිංහ-යාට, **විජ්ඣිතුං** විදින්නට, **තං සරං** ඒ, ඊය **ඛිපි** යැවී ය.

29. **සරො** හීය, **නලාටං ආහච්ච** නළලෙහි වැදී, **තස්ස** ඔහුගේ, **මෙත්තචිත්තෙන තු** මෙත් සිත නිසා වනාහි, **කුමාරපාදමූලෙ එව** කුමාරයාගේ පා මුල ම, **නිවත්තො** නැවතුණේ, **භූමියං** බිම, **පති** වැටුණේ ය.

30. **යාව තතියං** තුන්වන වාරය දක්වා, **තථා ආසි** එසේ විය. **තතො** ඉක්බිති **මිගාධිපො** සිංහයා **කුජ්ඣි** කිපුණේ ය. **තතො** ඉන්පසු, **ඛිත්තො සරො** විදින ලද හීය, **තස්ස කායං** ඒ සිංහයාගේ ශරීරය, **නිබ්භිජ්ජ** සිදුරු කරගෙන, **නික්ඛමි** නික්මුණේ ය.

31. **සො** හෙතෙම **සකෙසරං** කෙසරු සහිත **සීහසීසං** සිංහ හිස **ආදාය** රැගෙන **පුරං** නගරයට **අගා** ගියේ ය. **තදා** එදින, **මතස්ස වඞ්ගරාජස්ස** මැරුණු වංග රජුගේ **සත්තාහානි අහු** සත්වන දිනය (සතිය) විය.

32. **රඤ්ඤො** රජුට, **අපුත්තකත්තා ච** පුතුන් නැති බැවින් ද, **අස්ස** ඔහුගේ, **කම්මුනා** (මේ සිංහයා මැරීමේ) ක්‍රියාවෙන්, **පතීතා ච** ප්‍රකට බැවින් ද, **රඤ්ඤො** රජුගේ, **නත්තුත්තං ච** මුණුබුරු බව, **සුත්වා ච** අසා ද, **මාතරං** මව, **සංජානිත්වා ච** හැඳිනගෙන ද

33. **සන්නිපතිතා** රැස් වූ, **අඛිලා අමච්චා** සියලු ඇමතිවරු, **එකමානසා** එක සිතින්, **සීහබාහු කුමාරස්ස** සිංහබාහු කුමාරයාට, **රාජා හොහි ඉති** රජ වන්න යැයි, **අබ්‍රවුං** කීහ.

34. **සො** හෙතෙම **රජ්ජං** රාජ්‍යය, **සම්පටිච්ඡිත්වා** පිළිගෙන, **මාතු** මවගේ, **පතිස්ස** ස්වාමියාට, **තං** ඒ රාජ්‍යය, **දත්වා** දී **සීහසීවලිං ආදාය** සීංහසීවලිය ගෙන, **සයං** තෙමේ, **ජාතභූමිං** උපන් බිමට, **ගතො** ගියේ ය.

35. **තත්‍ථ** එහි, **නගරං** නුවරක්, **මාපෙසි** සැදීය. **තං** එය, **සීහපුරං ඉති** සිංහ පුරය යැයි, අභූ විය, **යොජනසතෙ අරඤ්ඤෙ** යොදුන් සියයක් වනයෙහි, **ගාමෙ ච අපි** ගම්වැසියන් ද **නිවෙසෙසි** වාසය කරවීය.

36. **තස්මිං ලාරට්ඨෙ** එම ලාටරටෙහි, **පුරෙ** නගරයෙහි, **සීහබාහු නරාධිපො** සිංහබාහු රජතුමා, **සීහසීවලිං** සිංහසීවලී, **මහෙසිං කත්‍වාන** මෙහෙසිය කොට, **රජ්ජං කාරෙසි** රාජ්‍යය කරවී ය.

37. **සා මහෙසී** ඒ මහේෂිකාව, **සොළසක්ඛත්තුං** සොළොස් වරක්, **දුවෙ දුවෙ යමකෙ** දෙදෙනා බැගින් වූ නිවුන් වූ, **පුත්තෙ** දරුවන්, **ජනයි** වැදුවා ය, **ජෙට්ඨකො** දෙටුපුතා, **විජයො නාම** විජය නම් වීය.

38. **දුතියො** දෙවැන්නා **සුමිත්තො නාම** සුමිත්ත නම් වේ, **සබ්බෙ දවත්තිංස පුත්තකා** සියලු පුත්තු තිස්දෙදෙනෙකි, **රාජා** රජතුමා, **කාලෙන** සුදුසු කාලයෙහි, **විජයං** විජය කුමරු, **උපරජ්ජෙ** යුවරජ තනතුරෙහි, **අභිසෙචයි** අභිෂේක කළේ ය.

39. **තෙ** ඔවුහු, **අනෙකානි** නොයෙක්, **දුස්සහානි** ඉවසිය නොහැකි දෑ, **සාහසානි,** සැහැසිදේ, **කරිංසු** කළහ. **විජයො විසමාචාරො** - විජය විෂමාචාර ඇත්තෙකි. **තං පරිසා අපි ච** (ඔහුගේ) ඒ පිරිස ද **ආසි** එසේම වූහ.

40. **කුද්ධො** කිපුණා වූ, **මහාජනො** මහජනයා, **තමත්‍ථං** ඒ කරුණ, **රඤ්ඤො** රජුට, **පටිවෙදයි** දැන්වීය, **රාජා** රජතුමා, **තෙ** ඔවුන්, **සඤ්ඤපෙත්‍වාන** දැනුවත් කොට, **සාධුකං** මනාකොට, **පුත්තං** පුතුට, **ඔවදි** අවවාද කළේ ය.

41. **දුතියං** දෙවනුව ද, **සබ්බං** සියල්ල, **තථා එව ආසි** එසේම සිදුවිය, **තතියං** පන තුන්වෙනුව වනාහි, **කුද්ධො මහාජනො** කිපියා වූ මහජනයා, **තෙ** ඔබගේ **පුත්තං** පුතා, **ඝාතෙහි ඉති** ඝාතනය කරවැ'යි. **ආහ.** කීය.

42. **අථ** ඉක්බිති, **රාජා** රජතුමා, **තං විජයං ච** ඒ විජය කුමරු ද, **තස්ස** ඔහුගේ, **තං පරිවාරං** ඒ පරිවර ද යන, **සත්තසතානි** සත්සියයක්, **පුරිසෙ** මිනිසුන්, **අඩ්ඪමුණ්ඩකෙ කාරෙත්‍වා** (හිස) අඩක් මුඩු කරවා.

43. **නාවාය** නැවක, **පක්ඛිපාපෙත්‍වා** දම්මවා **සාගරෙ** සයුරෙහි, **විස්සජ්ජාපෙසි** පාකර යැවී ය, **තථෙව** එසේම, **තෙසං** ඔවුන්ගේ, **භරියායො ච** භාර්යාවන් ද, **කුමාරකෙ ච** කුමාරවරුන් ද (මුහුදට යැවීය).

44. **විසුං විසුං** වෙන් වෙන්ව, **විස්සට්ඨා** යවන ලද, **තෙ පුරිස ඉත්ථී කුමාරකා** ඒ පුරුෂයෝ ස්ත්‍රීහු හා කුමාරවරු, **විසුං විසුං** වෙන් වෙන් වූ, **දීපකස්මිං** දිවයිනෙක්හි, **ඔක්කමිංසු** ගොඩ බැස්සහ, **වසිංසු ච** වාසය කළාහු ද වෙති.

45. **කුමාරොක්කන්තදීපකො** කුමාරවරුන් ගොඩ බැස්සා වූ දිවයින, **නග්ගදීපොති නග්ගදීප** යැයි, **ඤායිත්ථ** හැඳින්වීය, **හරියොක්කන්තදීපො තු** භාර්යාවන් ගොඩබැස්සා වූ දිවයින වනාහි, **මහිලාදීපකො ඉති** මහිලා දිවයින යැයි හැඳින්වීය.

46. **විජයො පන** විජය වනාහි, **සුප්පාරකෙ පට්ටනම්හි** සුප්පාරක පටුනෙහි, **ඔක්කමි** ගොඩබැස්සේ ය, **එත්ථ** මෙහිදී (ද) **පරිසාසාහසෙන** පිරිසගේ සැහැසි ක්‍රියාවලින්, **භීතො** බිය වූයේ, **නාවං** නැවට, **පුන** නැවත, **ආරුහි** නැංගේ ය

47. **තථාගතස්ස** තථාගතයන්ගේ, **යමකගුණ්ණානං සාලානං** යමක ලක්ෂණ ඇති සල් ගස්, **අන්තරානං** අතරෙහි, **නිබ්බාණං** නිවනට **සයිතදිනෙ.** සැතපුන දිනයේ. **ථිරමති** ස්ථිර නුවණ ඇති **විජයනාමකො** විජය නම් වූ **කුමාරො,** කුමාරයෙක් **තම්බපණ්ණිදීපෙ** තම්බපණ්ණි දිවයිනෙහි **ඔතිණ්ණො** බැස ගත්තේය.